www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව විරෝධතාවයේ යෙදුන ගොවීන් මර්දනයට ලක් කරයි

## Sri Lankan government cracks down on protesting farmers

**නිහාල් ප්‍රනාන්දු සහ ඩබ්ලිව්.ඒ. සුනිල්**
**එතැන සිට වාර්තා කරයි**
**2007 ජුනි 28**

ජල යෝජනා ක්‍රමයක් සඳහා ඉඩකඩ ලබා ගැනීම ට ඔවුන් පදිංචි ස්ථානවලින් බලහත්කාරයෙන් ඉවත් කිරීමට විරුද්ධව වයඹ පලාතේ ගොවීන් දහස් ගනනක් විරෝධතා උද්ඝෝෂනයක යෙදීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා පොලීසිය අත් අඩංගුවට ගැනීම් මාලාවක් සිදු කර ඇත. මෙම අත් අඩංගුවට ගැනීම් සිදු කෙරුනේ වාරියපොල ආසන්නයේ පිටිසර ගම් කිහිපයක ගොවීන් සහ වාරිමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා ඇමති චමල් රාජපක්ෂ අතර ජූනි 11 වෙනි දා මුහුන ට මුහුන ලා ගැටුමක් ඇති වීමෙන් පසුව ය.

ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරෙකු වූ ඇමතිවරයා පරීක්ෂන චාරිකාවක් සඳහා එදින ප්‍රදේශයට පැමින සිටියේ ය. ජල යෝජනා ක්‍රමයේ කොටසක් ලෙස  පලාත හරහා ගලා බසින ප්‍රධාන ගංගාවක් වූ දැදුරු ඔය හරහා ආන්ඩුව වේල්ලක් ඉදි කරමින් තිබේ. වේරහැරයාගම, කනෝගම, පොතුවැව ඇතුලු ගම්මාන කිහිපයක ගොවීන් ක්ෂනිකව අවතැන් වීමට නියමිත අතර ඔවුන්ව නැවත පදිංචි කිරීමේ දී ප්‍රමානවත් පහසුකම් නැතිකම කෙරෙහි ඔවුහු කෝපයට පත්ව සිටිති.

භාර්යාවන්, ලමුන් ඇතුලු 2000ක් පමන ගොවීහු ජූනි11 වෙනිදා වේරහැරයාගම පැවති උද්ඝෝෂනයට සම්බන්ධ වූහ. ස්වයං රැකියා ඇමති සරත් නාවින්න සහ මහා මාර්ග ඇමති ටී.බී. ඒකනායක සමග රාජපක්ෂ දහවල් එම ස්ථානයට පැමිනි විට තමන් ඉවත් කිරීමේ දී පැන නගින ගැටලු සම්බන්ධයෙන් ඔවුහු නිශ්චිත විසඳුම් ඉල්ලා සිටියහ. කිසිදු විසඳුමක් ඉදිරිපත් නොකල රාජපක්ෂ දඩබ්බර ලෙස ගොවීන්ට මෙසේ පැවසී යඃ "ඔයාලා කියන දේවල් අපට කරන්න බැහැ. ඔයාලා බලාපොරොත්තු වන ආකාරයට අපට ඔයාලට මාලිගාවල් හදලා දෙන්න බැහැ. මොන විරුද්ධත්වයක් ආවත් අප මේ ව්‍යාපෘතිය කරනවා."

එම අවස්ථාවෙහි උද්ඝෝෂකයන් අතර සිටි එක් අයෙකු කෝපයෙන් පෙරලා පැවසූවේඃ "ඔයාලා මාලිගාවල සැප පහසු ජීවිත ගත කරනවා අපි මෙහේ දුක් විඳිනවා අපේ ප්‍රශ්නවලට අපට විසඳුමක් අවශ්‍යයි." රාජපක්ෂ එම ස්ථානයෙන් ඉවත්ව යාමට උත්සාහ කල විට ඔහුගේ වාහනය වට කර ගත් උද්ඝෝෂකයෝ ඔවුන්ගේ ගැටලු විසඳීමේ ලිඛිත පොරොන්දුවක් ඉල්ලා සිටියහ. පොලීසිය හා ඇමති ආරක්ෂක නිලධාරිහු ඇමතිවරුන් වහාම එම ස්ථානයෙන් ඉවතට ගෙන ගියහ.

"ව්‍යාපෘති අධ්‍යක්ෂ අපව රවටන නිසා ඇමතිතුමා එනබව දැනගත්තම අපේ ප්‍රශ්නවලට ඔහුගෙන් සාධාරන විසඳුමක් ලැබෙයි කියලා හිතාගෙනයි අප ගියේ. ජනාධිපතිවරනයේ දී (2005 නෙවැම්බර්) මේ ප්‍රදේශයේ සියයට 90ක් ම ඡන්දෙ දුන්නෙ ජනාධිපති මහින්ද රාජපක්ෂට" බව ලෝක සමාජවාදී වෙබ් අඩවියට ගොවියකු පැවසී ය.

විරෝධතා උද්ඝෝෂනය පිටුපසින් "අදෘෂ්‍යමාන දේශපාලන හස්තයක්" තිබුන බවට ආන්ඩුව කරන චෝදනාව දැදුරු ඔය ව්‍යාපෘතිය නිසා අවතැන්වන්නන් ගේ සංවිධානයේ සභාපති එස්. පී. ලුවිස් සිංඤ්ඤෝ ප්‍රතික්ෂේප කලේ ය.  "ඔවුන්ට අවශ්‍ය අපව අධෛර්යමත් කිරීමටත් අපේ ව්‍යාපාරය කඩාකප්පල් කිරීමටත්" බව ඔහු ලෝසවෙ අඩවියට පැවසුවේ ය. සියලු ම ප්‍රධාන දේශපාලන පක්ෂ සම්බන්ධව විවේචනාත්මකව ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කලේ "මේ දේශපාලන නායකයො හොරු. යුද්දෙ නැවතත් පටන් ගත්තට පස්සෙ එහෙ මිනිස්සු අවතැන් වෙනව, මැරෙනවා, මෙහේ අපව අවතැන් කරනවා. අපේ දරුවන්ගේ අනාගතයට මොකක් වෙයිද?"

සිද්ධිය අවසන් වූ වහාම අමාත්‍ය මාධ්‍ය කන්ඩායම විසින් ගත් වීඩියෝ දර්ශන උපයෝගී කර ගෙන ප්‍රදේශයේ පොලීසිය ගොවීන් අත් අඩංගුවට ගැනීම ආරම්භ කලේ ය. දින දෙකක් ඇතුලත 20ක්

අත් අඩංගුවට ගත් අතර ඔවුන්ට එරෙහිව නීතිවිරෝධී ලෙස රංචු ගැසීම, ඇමතිවරයාගේ රැස්වීම කඩාකප්පල් කිරීම, රජයේ වාහනවලට අලාභහානි කිරීම, සහ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට තුවාල සිදු කිරීම ඇතුලු චෝදනා ගනනාවක් යටතේ නඩු පැවරීමට නියමිත ය.

අත් අඩංගුවට පත්ව සිටින අයට සහයෝගය දැක්වීම සඳහා ජූනි 19 දහසකට අධික ජනයා උසාවියෙන් පිටත රැස්වී සිටියහ. රැඳවුම් භාරයේ සිටින අය වහාම නිදහස් කරන ලෙස ද පොලිස් අඩන්තේට්ටම් නතර කරන ලෙස ද ගම්මු ඉල්ලා සිටියහ. නීතිඥයන් හැර සෙසු කිසිවකු උසාවියට ඇතුල්වීම පොලීසිය වැලැක්වූවේ ය. රැස්ව සිටි පිරිස අතර සිටි තවත් හතර දෙනෙකු සිවිල් ඇඳුමෙන් සිටි පොලිස් නිලධාරීන් විසින් අත් අඩංගුවට ගන්නා ලදී. අත් අඩංගුවට ගෙන සිටින සියලු දෙනාම ජූලි 3 දක්වා බන්ධනාගාර ගත කර ඇත.

යෝජිත දැදුරු ඔය ජල යෝජනා ක්‍රමය යටතේ වාරියපොල, යාපහුව, හිරියාල සහ කුරුනෑගල මැතිවරන කොට්ටාශවල 1000 ආසන්න පවුල් සංඛ්‍යාවක් ඉවත් කිරීමට නියමිත ය. මාර්තු මාසයේ ආරම්භ කල ව්‍යාපෘතියට වගාකල ඉඩම් අක්කර 5000ක් පමන ජලයෙන් යටවනු ඇතැයි බලාපොරොත්තු වේ. වගාවට යෝග්‍ය ඉඩම්, අහිමිවන දේපලවලට වන්දි සහ ජලය, සෞඛ්‍ය, අධ්‍යාපනය හා ප්‍රවාහනය වැනි මූලික පහසුකම් සපයන බවට ආන්ඩුව පොරොන්දු වූ නමුත් ඒ පොරොන්දු කිසිවක් මේ දක්වා ඉටු වී නැත.

නැවත පදිංචි කිරීමේ පලමුවන අදියර ලෙස මාර්තු මාසයේදී පවුල් 72 පුත්තලම් දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව, නෙලුම්ගමට ගියහ. ඔවුන් මුහුන දී සිටින දුෂ්කර කොන්දේසි ගැන ඉක්මනින්ම සෙසු ගොවීන්ට දැන ගැනීමට ලැබුනි. අලි, වල් ඌරන් හා වලසුන් ට ඇති බිය නිසා බොහෝ කාන්තාවන් සහ ලමයින් එහි ගොස් නැත.

නැවත පදිංචි කල ගොවියකුගේ බිරිඳ වූ ඊ.එම්. කරුනාවතී ලෝසවෙඅට මෙසේ පැවසීය: "ආන්ඩුව අපට ගොඩින් අක්කරයක් සහ මඩින් අක්කරයක් දීලා තියෙනවා. තාවකාලික පැලක් හදාගන්න රුපියල් 16,000 පමනයි අපට ලැබුනේ. ඒකෙන් මිනිස්සුන්ට හදාගන්න පුලුවන් පොල්අතු හෙවිල්ලපු කටුමැටි පැලක් විතරයි. ඉඩම සුද්ධ කරගන්න විතරයි ඒගොල්ලෝ අපට උදව් කලේ වගාවට සුදුසු ආකාරයට ඉඩම් අස්වද්දා ගැනීම සඳහා අනෙක් සියලුම වියදම් දරන්න වුනේ අපට. පොරොන්දු වුන විදිහට ගොවි උපකරන හෝ බීජ දුන්නේ නැහැ. තවමත් අපේ ඉඩම්වලට පොරොන්දු වුන වන්දි මුදල් ගෙවලා නැහැ. කවදා ඒවා ගෙවයිද කියලා අපට විශ්වාසයක් නැහැ.

"දැනට අපට මාසෙකට රුපියල් 6,000ක දීමනාවක් ලැබෙනවා. මාස 18ක් ඒක ගෙවනවා කියනවා. නමුත් වැඩ සිද්ධ වෙන ආකාරයට ඒ ගැන විශ්වාස කරන්න බැහැ. බීමට සහ නෑමට ප්‍රමානවත් තරම් වතුර ලැබෙන්නේ නැහැ. කරුවලගස්වැවේ සිට ලඟම ටවුම ආනමඩුවට කිලෝමීටර් 20ක් එන්න ඕනෑ. බස් නැති නිසා මිනිස්සු ත්‍රීවීල් කුලියට අරගෙන එන්නෙ. පුංචි ඉස්කෝල දෙකක් විතරයි ඒ පලාතේ තියෙන්නේ. අපේ ලමයින් කිලෝමීටර් 3-4ක් පයින් ඇවිදගෙනයි ඉස්කෝලෙට යන්න ඕනෑ."

දෙදරු පියෙකු වූ එච්.ඇම්. ධර්මසේන තම උපන් ගම අත්හැර දමා යාමට සිදුවීම ගැන වේදනාවෙන් සිටියේ ය. පොතුවැව ගමේ ඔහුට අක්කර හතරක් තිබේ. වසර ගනනාවක් දුක් මහන්සිවී ඔහුගේ පවුල සඳහා නිවසක් තනා ගෙන තිබේ. නමුත් නැවත පදිංචි කිරීමේ දී කවරාකාරයේ ඉඩමක් ලැබේවි දැයි ඔහුට අදහසක් නැත. "අවිනිශ්චිතකම සහ දුෂ්කරතා නිසා නෙලුම්ගමට ගිය සමහර මිනිසසු ආපසු ආව" බව ඔහු පැවසුවේ ය.

ගොවීන් බරපතල දුෂ්කරතාවලට මුහුන දෙමින් සිටින බව ධර්මසේන විස්තර කලේ ය. "හැම දෙයකම මිල දිනපතා ඉහල යනකොට ප්‍රමානවත් ආදායමක් නැතිව කොහොමද මිනිස්සු ජීවත් වෙන්නේ? ගොවිතැන ලාබ නැහැ. අක්කරයක් වගාකරන්න අඩු ගනනේ රුපියල් 20,000 ක් අවශ්‍යයි. අපට වාරි ජලය නැහැ.

"ආන්ඩුව අපව උගුල්ලා, මූලික පහසුකම් නැතිව කොහෙ හරි පදිංචි කලොත් අපට වෙන්නේ කබලෙන් ලිපට වැටුනා වගේ වැඩක්. ආන්ඩුව කෙලවරක් නොවන යුද්ධයක් කරනවා. ඒකෙ බරත් අපේ කරපිටට. උතුරු නැගෙනහිර කරන ආකාරයටමයි පාලකයො මෙහේ කම්කරුවන්ට සහ ගොවීන්ට සලකන්නෙත්.

"හැම ආන්ඩුවක් ම පොරොන්දු දෙනවා. නමුත් ඊට පස්සේ ඒවා නොතකා හරිනවා. යූඑන්පීඑක සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපව රැවැට්ටුවාට පස්සේ ඔවුන්ගේ නම 'ජනතා විමුක්ති පෙරමුන' නිසා ජනතා විමුක්ති පෙරමුන මිනිස්සු වෙනුවෙන් යමක් කරයි කියලා අප විශ්වාස කලා. ඔවුන් පහුගිය ආන්ඩුවේ ඉන්න කොට ගම්වල වැව් පුනරුත්ථාපනය කරනවා කිව්වා. නමුත් මේ පැත්ත පලාතේවත් ආවේ නැහැ." යි ඔහු පැවසුවේ ය.

ප්‍රදේශයේ ගොවීන් සමහරක් මානව හිමිකම් කොමිෂමේ කුරුනෑගල කාර්යාලයට ගිය නමුත් පලක් නොවූ බව ධර්මසේන පැවසුවේ ය. "අපේ පැමිනිල්ල ගැන විභාග කරනවා වෙනුවට එහි සිටි නිලධාරියෙක් අප බොරු කියනවා කියලා අපට චෝදනා කලා මෙම

දේශපාලන පක්ෂ සහ ක්‍රමය ගැන මා අතිශයින්ම කලකිරීමට පත්වෙලා ඉන්නේ" ඔහු කීවේ ය.

නැවත පදිංචි කිරීමට නියමිත මේ ගම් තුනේම දරිද්‍රතාවය සහ පහසුකම් අඩුකම පැහැදිලිව පෙනෙන්නට තිබේ. එහි ඇත්තේ ප්‍රාථමික පාසැල් දෙකක් සහ ද්විතීයික එක් පාසැලක් පමනි. බොහෝ සිසුන් ඒවාට සෑහෙන දුරක් වාහනයකින් හෝ පයින් ගමන් කල යුතු ය. ආන්ඩුවේ බස් සේවයක් නිතර ම නැත. වාරියපොල රෝහලක් ඇති නමුත් බරපතල අසනීපයක් සඳහා ප්‍රතිකාර ගැනීමට කිලෝමීටර් 30 පමන දුරින් පිහිටි කුරුනෑගල රෝහලට ඔවුන් යා යුතු ය.

වේරහැරයාගම වසර 50 ට පමන පෙර ජනයා පදිංචි කල ගමක් වුව ද තවමත් විදුලිබලය නැත. ජලය ලබා ගතයුත්තේ ලිං වලිනි. ගෙවල්වලින් බොහොමයක් මැටියෙන් තැනූ ඒවා ය. ප්‍රදේශය පුරාම රැකියා නැතිකම ඉහල මට්ටමක පවතී. තරුන ගැහැනු ලමෝ රැකියා සොයා නිදහස් වෙලඳ කලාපවලට යති. සමහරු මැද පෙරදිග ගෘහසේවිකාවෝ ලෙස යති. වෙනත් රැකියාවන් නැති නිසා තරුනයෝ බොහෝමයක් හමුදාවට බැඳෙන අතර සෙසු අය ගඩොල් කර්මාන්තයේ යෙදෙති.

ගම්වල පවතින මෙම කොන්දේසි දශක ගනනාවක් ආන්ඩුව විසින් ඒවා නිල වශයෙන් නොතකා හැරීමේ සහ ගොවි සහනාධාර කැපීමේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමීමේ ප්‍රතිඵලයකි. කෙසේනමුත් සිවිල් යුද්ධය වඩවඩා උත්සන්න වෙද්දී, රාජපක්ෂගේ ආන්ඩුව එහි බර කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ කොන්ද මතට පටවමින් සිටී. දැවැන්ත මිලිටරි වියදම් ගෙවනු ලබන්නේ අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සුබසාධන වැනි අත්‍යාවශ්‍ය සමාජ සේවාවන් සහ දැදුරු ඔය ජල යෝජනා ක්‍රමය වැනි ව්‍යාපෘතීන් සඳහා යෙදවිය යුතු අරමුදල් කපා හැරීම මගිනි.

විරෝධතා දැක්වූ ගම්මුන් කෙරෙහි ඇමති රාජපක්ෂ දැක්වූ උද්ධච්ච පිලිකුල කවර ප්‍රශ්නයක් සම්බන්ධයෙන් වුව ද විරෝධය දැක්වීම කෙරෙහි ආන්ඩුවේ ප්‍රතිචාරය කෙබඳු දැයි පෙන්නුම් කරන සලකුනකි. යුද්ධය සම්බන්ධයෙන් වේවා, කම්කරුවන්ගේ වැටුප් හෝ ගොවීන් මුහුන දෙන කොන්දේසි සම්බන්ධයෙන් වේවා ආන්ඩුව ප්‍රතිචාරය දක්වන්නේ ඒවා ද්‍රොහීන්ගේ ක්‍රියාවන් හෝ "සැඟවුන හස්තයක" ලෙස හෙලා දකිමිනි. ඒ අයුරින් විරෝධතා නිහඬ කිරීමට අසමත් වුවහොත්, මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පාගා දැමීමට සහ පොලිස් රාජ්‍ය මර්දනයක් දිගේලි කිරීමට ආන්ඩුව පසුබට නොවනු ඇත.

© www.wsws.org